# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
# ඇබෑර්තු

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුව පවතින අධ්‍යක්ෂ (සන්නිවේදන) තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන/ වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2025 ජනවාරි මස 24** දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය)

**සැ.යු.** : තමන් අයදුම්කරන තනතුර අයදුම්පත්‍රයෙහි ඉහලින් සඳහන් කිරීම අනිවාර්යය වේ.

1. **වැටුප් පරිමාණය-** 2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 67,485 - 4 x 1,630 / 8 x 2,170 - රු.91,365/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.142,000/- පමණ වේ).

2. **වයස් සීමාව -** අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 35ට නොඅඩු සහ 55 ට නොවැඩි විය යුතු ය.
(දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ සහ පාර්ලිමේන්තු සේවයේ සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

3. **අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද -**

අ) පිළිගත් විශ්විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබා ගත් ජනසන්නිවේදනය හෝ අලෙවිකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය

සහ

අලෙවිකරණය, මහජන සබඳතා, ආගන්තුක සහ සන්නිවේදන නායකත්ව භූමිකාවන්හි අවම වසර පහක වෘත්තීමය පළපුරුද්ද

හෝ

ආ) පිළිගත් විශ්විද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි ප්‍රදානය කරන ආයතනයකින් ලබා ගත් ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධිය, අලෙවිකරණය පිළිබඳ උපාධිය, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධිය, අලෙවි කළමනාකරණය පිළිබඳ විශේෂ උපාධිය, කලා උපාධිය (සන්නිවේදනය, ජන සන්නිවේදනය, මහජන සබඳතා සහ මාධ්‍ය කළමනාකරණය, සන්නිවේදනය සහ නිර්මාණාත්මක කලා සහ සමාජ විද්‍යාව විෂයක් වශයෙන්) සත්කාරක සේවා සහ විනෝදාස්වාද කළමනාකරණ පිළිබඳ උපාධිය, ජනමාධ්‍යවේදය පිළිබඳ උපාධිය

සහ

අලෙවිකරණය, මහජන සබඳතා, ආගන්තුක සහ සන්නිවේදන නායකත්ව භූමිකාවන්හි වසර දහයක පළපුරුද්ද

හෝ

ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (පැරණි නිර්දේශය) එකවර විෂයයන් 04ක් සමත් වී තිබීම/ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී (නව නිර්දේශය) එකවර විෂයයන් 03ක් සමත් වී තිබීම සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අදාළ සිංහල/දෙමළ භාෂාව සඳහා සම්මාන සාමාර්ථයක්, ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ඇතුලත්ව විෂයන් 06 කින් දෙවරකට වඩා නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම

සහ

අලෙවිකරණය, මහජන සබඳතා, ආගන්තුක සහ සන්නිවේදන නායකත්ව භූමිකාවන්හි වසර විස්සක වෘත්තීමය පළපුරුද්ද

**4. බඳවා ගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන නිර්ණායකයන් පහත පරිදි වේ.

| අනු අංකය | නිර්ණායක |
|---|---|
| 1 | අමතර අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් |
| 2 | ඩිජිටල් මාධ්‍ය භාවිතය පිළිබඳ පළපුරුද්ද හා දැනුම |
| 3 | භාෂා හා සන්නිවේදන හැකියාවන් |
| 4 | මානව සම්පත් කළමනාකරණය හා පරිපාලන දැනුම |
| 5 | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතා |

**5. වෙනත් ප්‍රතිලාභ** - රියදුරු සමඟ නිල වාහනයක්

**6. සේවා නියමයන් හා කොන්දේසි:-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අයදුම්කරු යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, අභ්‍යන්තර අයදුම්කරුවකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත. දැනට රාජ්‍ය අංශයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු නොලැබූ වයස අවුරුදු 45ත් 55ත් අතර අපේක්ෂකයෙකු තෝරා ගනු ලැබුවහොත්, එම පත්වීම දීර්ඝ කිරීමේ හැකියාව ඇති වසර දෙකක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනමට යටත්ව සිදු කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරු, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරු පත් කරනු ලැබීමට පෙර ඔවුන් පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

7. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඇ) වෘත්තීයමය සුදුසුකම් සනාථ කෙරෙන සහතික

(ඈ) පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

8. රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

9. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා හරහා එවනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2024 දෙසැම්බර් මස 31 වැනි දින.